**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**

**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020**

# 43 - චිත්‍ර

## අවසාන ලකුණු ගණනය කිරීම.

**I පත්‍රය -** විවිධ වර්ගයේ ප්‍රශ්න 40 ක් ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. එක් ප්‍රශ්නයකට 01 ලකුණ බැගින් හිමි වේ.

(1 x 40) = ලකුණු 40

**II පත්‍රය -** නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය.
එක් ප්‍රශ්නයක් පමණක් සැපයෙන අතර, ඒ සඳහා නිර්ණායක 6 ක් ඔස්සේ ලකුණු 05 බැගින් හිමි වේ.

(6 x 5) = ලකුණු 30

**III පත්‍රය -** චිත්‍ර සංරචනය/ මෝස්තර නිර්මාණය/ ග්‍රැෆික් චිත්‍ර ඇතුළත් කොටස් 03 කින් යුතු ප්‍රශ්න පත්‍රයකි.
මින් තෝරාගත් එක් චිත්‍රයක් පමණක් ඇඳිය යුතු වේ.
නිර්ණායක 05 ක් ඔස්සේ ලකුණු 06 බැගින් හිමි වේ.

(5 x 6) = ලකුණු 30

**මුළු එකතුව ලකුණු 100**

Department of Examinations - Sri Lanka



Download all Past Papers➤ https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020 (2021)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................
..................................................
.................................................. √ △ 4/5

(ii) ..................................................
..................................................
.................................................. √ △ 3/5

(iii) ..................................................
..................................................
.................................................. √ △ 3/5

(03) එකතුව ➡ □ 10/15

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම
   I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
   II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
   III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දැක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
   IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
   **V. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**


Download all Past Papers➢ https://bookbeekid.com/resource/past-papers/

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020

## 1. පත්‍රය - චිත්‍ර

**ඉගෙනුම්ඵල** :-

1 - ප්‍රායෝගික අභ්‍යාස තුළින් ලබන සිද්ධාන්ත හා ශිල්ප ක්‍රම පිළිබඳ අවබෝධය මෙන් ම පෝෂණය කරගත් නිපුණතා පිරික්සීම හා මැන බැලීම.

2 - පාරම්පරික කලා කර්මාන්ත පිළිබඳ ශිල්ප ක්‍රම, අලංකාර විධි, අමුද්‍රව්‍ය භාවිතය හා ආශ්‍රිත ප්‍රදේශ පිළිබඳ ප්‍රජානන හැකියාව පිරික්සීම.

3 - විශ්ව ශිල්පීන් හා ඔවුන්ගේ කලා කෘති හඳුනාගෙන ඒවායේ පසුබිම, මාධ්‍ය භාවිතය, වස්තු විෂය, ශිල්ප ක්‍රම හා භාව ප්‍රකාශන පිළිබඳ ඇගයීමේ හා රසවිඳීමේ හැකියාව මැන බැලීම.

4- ශ්‍රී ලංකාව, ඉංදියාව, යුරෝපය ආශ්‍රිත සම්භාව්‍ය කලා නිර්මාණයන්ගේ සංස්කෘතික පසුබිම පිළිබඳ නිපුණතා පිරික්සීම.

චිත්‍ර 1, ප්‍රශ්න පත්‍රය සැකසී ඇත්තේ එම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයෙන අයුරිනි. ප්‍රශ්න 40 ක් අඩංගු වන මෙම පත්‍රයේ නිවැරදි පිළිතුරු ලකුණින් ද වැරදි පිළිතුරු × ලකුණින් ද රතුපාටින් ලකුණු කළ යුතු වේ. එකිනෙක ප්‍රශ්නයේ අංකයට මුලින් හරි වැරදි ලකුණු යෙදීම පහසුවේ. අපේක්ෂකයා යම් ප්‍රශ්නයකට පිළිතුරු සපයා නැත්නම් එම ප්‍රශ්නයේ තිත් ඉර මත රතු පාටින් ඉරක් ඇඳ වැරදි පිළිතුරක් සේ සලකා × ලකුණ යොදන්න.

ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න විවිධ රටාවන් අනුව සැකසී ඇත. ඡායා රූ ඇසුරු කරගෙන පිළිතුරු විමසන, කෙටි පිළිතුරු සපයන, හිස්තැන් පුරවන, ඡායා රූ සමූහයක් සම්බන්ධතා අනුව එකිනෙක සැසඳීමට සලස්වන, අර්ථ පැහැදිලිවනසේ වාක්‍ය තැනීම හා කලා කෘති ඇගයීමට බඳුන් කරවන, ප්‍රශ්න රටාවන්ගෙන් සමන්විත වේ. විෂය නිර්දේශයේ අන්තර්ගතය තුළ සැකසෙන ප්‍රශ්න අතර ඉතා පහසු ඒවා මෙන් ම ක්‍රමයෙන් ගැඹුරු වී යන ප්‍රශ්න ද තිබීම ප්‍රශ්න පත්‍රයක ස්වභාවයයි. විෂය මාලාව අවසන් කර විභාගයට ඉදිරිපත් වන සියලුම අපේක්ෂකයන් විෂය නිර්දේශයේ අන්තර්ගත විෂය කරුණු අධ්‍යයනය කර අපේක්ෂිත අරමුණු හා නිපුණතා කරා ලගා වී තිබේය යන උපකල්පනය ප්‍රශ්න පත්‍රය සැකසීමේ දී ප්‍රධාන සාධකය බවට පත්ව ඇත. සිසුන් එම තත්ත්වයන්ට පත් වීම හෝ නොවීම පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මත රඳා පවතී. කිසියම් රටාවකට අනුගතව ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයන අයුරු උගන්වනවා වෙනුවට ඕනෑම අභියෝගයකට මුහුණ දියහැකි අයුරින් විෂය දැනුමෙන් සිසුන් පෝෂණය කිරීමේ වැදගත්කම මෙහිලා දැඩිව අවධාරණය කරමු.

ප්‍රශ්න පත්‍රයේ බොහෝ ප්‍රශ්නවලට වාස්තවික ව පිළිතුරු සැපයිය හැකි වන අතර රචනාමය ස්වරූපයෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ද ඇතුළත්ව ඇත. කිසියම් පාරිභාෂිත වචනයක හෝ සිද්ධාන්තයක අදහස පැහැදිලිව ප්‍රකාශ වන පරිදි අර්ථවත් වැකියක් ලිවීමේ අවස්ථාවක් සලසා ඇත. අපේක්ෂකයා සපයන වැකිය ඇසුරෙන් දෙන ලද වචනයේ අර්ථය හොඳින් පැහැදිලි විය යුතුය. මෙයින් අදහස් කෙරෙනුයේ චිත්‍ර හදාරණ සිසුන්ගේ රචනාමය ප්‍රකාශන හැකියාව මැන බැලීමයි.


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

ප්‍රශ්න අංක 36 - 40 දක්වා ඇගයීම සඳහා වූ ප්‍රශ්න ද එවැනි නිදහසේ පිළිතුරු සැපයීම සඳහා සැකසුවකි. අපේක්ෂකයනට තම දැනුමේ හා වින්දනයේ තරමට නිදහසේ පිළිතුරු සැපයීමට ඉඩ කඩ ඇත. එසේ වුව ද අපේක්ෂකයන් අනවබෝධයෙන් විවිධාකාර පිළිතුරු සපයන බව පෙනේ. සමහර අපේක්ෂකයන් කලා කෘතිය හඳුනා නොගෙන ඒ තුළ දකින දේ ගැන ලියන අවස්ථා දැක ඇත. ඇගයීම යනු කෘතිය හඳුනාගෙන අගය වටහාගෙන විචාරාත්මකව වින්දනාත්මකව විග්‍රහ කිරීමයි. කලා කෘතිය ද්‍රව්‍යමය භාණ්ඩයක් සේ සලකා එහි දකින දේ විග්‍රහ කිරීම ඇගයීමක් නොවනු ඇත. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අරමුණු පහක් ඔස්සේ පිළිතුරු සැපයීමට සලස්වා ඇත්තේ ඒ ඔස්සේ නිසි ඇගයීමකට ප්‍රවේශයක් ලබාදෙන අටියෙනි. එසේ ම මෙහි දී අංග සම්පූර්ණ වාක්‍යකින් පිළිතුර සෑපයීම අපෙක්ෂා කෙරේ. එහෙයින් තනිවචනයකින් සපයා ඇති පිළිතුරු සඳහා ලකුණු දීමෙන් වලකින්න.

ප්‍රථමයෙන් ම අපේක්ෂකයා කලාකෘතිය හඳුනාගෙන ඇති බවට සෑහීමට පත්විය හැකි විය යුතු ය. දී ඇති කලා කෘතිය විෂය නිර්දේශයේ අන්තර්ගත ඒකකයක් හා සෘජු ලෙස සම්බන්ධ වන්නක් වන හෙයින් අනිවාර්යයෙන් ම අපේක්ෂකයාට එය හඳුනාගැනීමට හැකිවීම වැදගත් ය. ඒ අනුව එය හඳුනාගත් බව ,තේමාව, ශිල්ප ක්‍රම, ශිල්පීය කුසලතාව, භාවමය හැඟීම්, විග්‍රහ වන පරිදි දී ඇති උප ශීර්ෂ යටතේ නිරවුල් වාක්‍ය පහක් ලිවිය යුතු වේ. එම වාක්‍ය තුළින් කලාකෘතිය පිළිබඳව උප ශීර්ෂයෙන් අපේක්ෂිත අර්ථය පැහැදිලි විය යුතු ය. මෙම පිළිතුරු වාස්තවික බවින් තොර වීම හා රචනා ස්වරූපයක් ගන්නා බැවින් ඉතා විමසිල්ලෙන් ලකුණු ප්‍රදානය කිරීම ද කළ යුතු වේ. අපේක්ෂිත අරමුණුවලින් බැහැරව හෝ අර්ථය පැහැදිලිව ඉදිරිපත් නොවන සේ සපයා ඇති පිළිතුරු වලට ලකුණු දීමෙන් වළකින්න.

II හා III යන ප්‍රායෝගික පත්‍ර සඳහා ලකුණු 30 න් තීරණය කිරීම සිදුවන බැවින් එහි විෂමතා සිදු වීමට ඇති ඉඩකඩ වැඩිය. මෙය 100 යේ ප්‍රතිශතයක් සේ සැලකිය හැකි නම් පිළිතුරු පත්‍රයට හිමි ලකුණු නිවැරදිව තීරණය කිරීමට පහසුවනු ඇත.

ලකුණු 30 න් හිමි ලකුණු තීරණය කිරීමේ දී එය සියයට ප්‍රතිශතයක් සේ සිතීම වැදගත්ය. මේ සඳහා පහත සඳහන් වගුව, ඔබ ප්‍රදානය කරන ලකුණු සියයට කීයද යන්න තීරණය කරගැනීමට පහසු වනු ඇත.

| | | |
|---|---|---|
| 1 - 01, 02, 03, | 11 - 34, 35, 36, 37, | 21 - 68, 69, 70, |
| 2 - 04. 05. 06. 07. | 12 - 38, 39, 40, | 22 - 71, 72, 73, |
| 3 - 08, 09, 10, | 13 - 41, 42, 43, | 23 - 74, 75, 76, 77, |
| 4 - 11, 12, 13, | 14 - 44, 45, 46, 47, | 24 - 78, 79, 80, |
| 5 - 14, 15, 16, 17, | 15 - 48, 49, 50, | 25 - 81, 82, 83, |
| 6 - 18, 19, 20, | 16 - 51, 52, 53, | 26 - 84, 85, 86, 87, |
| 7 - 21, 22, 23, | 17 - 54, 55, 56, 57, | 27 - 88, 89, 90, |
| 8 - 24, 25, 26, 27 | 18 - 58, 59, 60, | 28 - 91, 92, 93, |
| 9 - 28, 29, 30, | 19 - 61, 62, 63, | 29 - 94, 95, 96, 97 |
| 10 - 31, 32, 33, | 20 - 64, 65, 66, 67, | 30 - 98, 99, 100, |

Department of Examinations - Sri Lanka

Download all Past Papers ➢ https://bookbeekid.com/resource/past-papers/

OL/2020/43-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 | S | I**

| පත්‍රය | ලකුණු |
| --- | --- |
| I | |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
**General Certificate of Education (Ord. Level) Examination, 2020**

| | |
| --- | --- |
| **චිත්‍ර** | **I** |
| சித்திரம் | **I** |
| Art | **I** |

*පැය එකයි*
*ஒரு மணித்தியாலம்*
*One hour*

| | |
| --- | --- |
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| ගණිත පරීක්ෂක | |

※ **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

**විභාග අංකය** :......................................

Department of Examinations - Sri Lanka

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



**1.** ගම්පොළ යුගයට අයත් මෙම ගෘහ නිර්මාණය .................................... විහාර සංකීර්ණයට අයත් ය.

**2.** මෙම ගෘහ නිර්මාණය .................................... ශිල්පියා විසින් නිර්මාණය කරන ලද්දකි.

**3.** මෙය දකුණු ඉන්දීය .................................... ගෘහ නිර්මාණ කලා ලක්ෂණ පෙන්වයි.

**4.** මෙහි සුවිශේෂිත්වය වන්නේ ...................................... මාධ්‍යයෙන් නිමවා තිබීමයි.

**5.** මෙම ගොඩනැගිල්ලේ .................................... හි දක්නට ඇති නටන්නන් හා වයන්නන් දැක්වෙන කැටයම ජීවයෙන් හා චලනයෙන් යුක්තය.

● අංක **6** සිට **10** තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

**6.** හින්දු කෝවිල් ආශ්‍රිතව ඇතා, අශ්වයා, සිංහයා යන සත්ව සංකලනයෙන් නිම වූ කුළුණු ආධාරක මූර්තිය කුමක් ද?

..........................................................................................................

**7.** 'පරදුක්ඛ දුක්ඛිත' මුද්‍රාව නිරූපිත යැයි සැලකෙන ශෛලමය ආබද්ධ හිටි බුද්ධ ප්‍රතිමාව කුමක් ද?

..........................................................................................................

**8.** යාපනයේ සට්ටනාදර් ශිව දේවාලයේ සිතුවම්කොට තිබූ 'සුදු කුකුළා' නම් සිතුවම නිර්මාණය කළ ශිල්පියා කවුද?

..........................................................................................................

**9.** ඉන්දු නිම්නයෙන් හමුවූ නලඟන රුව නිර්මාණයේ දී භාවිත කොට ඇති ශිල්ප ක්‍රමය කුමක් ද?

..........................................................................................................

**10.** ප්‍රැක්සිටෙලස් නම් ශිල්පියා විසින් නිර්මාණය කළ 'හර්මීස් හා ඩයොනීසස්' නම් මූර්තිය අයත්වන්නේ කුමන යුගයට ද?

..........................................................................................................

● අංක **11** සිට **15** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා, ඊට යටින් ඉරක් අඳින්න.

**11.** මහනුවර දළදා මාලිගා සංකීර්ණයට අනන්‍ය වූ සුවිශේෂී ගෘහ නිර්මාණ අංගය වනුයේ,

(1) දළදා කුටියයි. (2) මඟුල් මඩුවයි.
(3) පත්තිරිප්පුවයි. (4) උල්පැන් ගෙයයි.

**12.** අනුරාධපුරයේ අශෝකාරාම විහාරස්ථානයට අයත් පන්කුළිය පිළිමය

(1) සමාධි සුවයෙන් වැඩ හිඳින හිඳි පිළිමයකි.
(2) මහමෙවුනාවේ සමාධි පිළිමයට සමාන වූවකි.
(3) අප්‍රකට මුද්‍රා ප්‍රකාශිත සුවිශේෂී පිළිමයකි.
(4) ධර්ම දේශනා කරන ස්වරූපයක් ප්‍රකාශිත පිළිමයකි.

**13.** පොළොන්නරුවේ අංක 1 ශිව දේවාලය

(1) පල්ලව ආභාසය මත කපා සැකසූ කලු ගලින් ඉදිකරන ලද්දකි.
(2) ක්‍රි.ව. 10 වැනි සියවසේ සොළීන් විසින් ඉදිකළ දේවාල අතුරින් එකකි.
(3) සොලී අධිරාජ්‍යයා වූ රාජරාජගේ මෙහෙසිය සිහිවීම පිණිස ඉදිකරන ලද්දකි.
(4) දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ලක්ෂණ අනුව ක්‍රි.ව. 13 වැනි සියවසේ ඉදිකරන ලද්දකි.

**14.** පැබ්ලෝ පිකාසෝගේ 'ගුවර්නිකා' සිතුවමේ සමස්ථ සංරචනාත්මක ප්‍රකාශය වනුයේ,

(1) මිනිසුන්ගේ හුදකලා බව හා වැලපීමයි. (2) යුද්ධයේ කුරිරු බව හා බිහිසුණු බවයි.
(3) සතුන්ගේ හා මිනිසුන්ගේ විලාපයයි. (4) යුක්තිය ඉල්ලා මොරදීම හා මරු වැළඳ ගැනීමයි.

**15.** අජන්තා සිතුවම් අතර 'කිඹුල්වත්පුර පිඬු සිඟා වැඩීම' බිතුසිතුවමෙහි බුදුරජාණන් වහන්සේගේ රුව විශාල ව නිරූපණය කිරීමට හේතු වී ඇත්තේ,

(1) පර්යාලෝක රීතිය අනුගමනය කිරීම උදෙසා ය.
(2) සිතුවමෙහි සම්පිණ්ඩනයට ගැළපෙන අයුරින් දැක්වීමට ය.
(3) බුදුන් වහන්සේගේ උත්තරීතරභාවය නිරූපණය කිරීම සඳහා ය.
(4) සිතුවමෙහි දක්නට ලැබෙන ගෘහ නිර්මාණයට ගැළපීම සඳහා ය.

● අංක **16** සිට **20** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

**16.** අල්පනාව : ..........................................................................................

**17.** ක්ෂයවෘද්ධි : ..........................................................................................


**18.** හයිරෝග්ලිෆික්ස් : ..........................................................................................


**19.** කුම්බා/කුම්භම් : ..........................................................................................

**20.** මරවාහනම් : ..........................................................................................

Department of Examinations - Sri Lanka

● අංක **21** සිට **25** තෙක් දී ඇති රූපසටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූපසටහන, ඉදිරියෙන් ඇති **A, B, C, D, E** යන ඒවා අතුරෙන් තෝරා, එහි අක්ෂරය **තිත් ඉර මත** ලියන්න.

**21.**  (.........)  **A**

**22.**  (.........)  **B**

**23.**  (.........)  **C**

**24.**  (.........)  **D**

**25.**  (.........)  **E**

Department of Examinations - Sri Lanka

● අංක **26** සිට **30** තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

**26.** මහනුවර ත්‍රිත්ව දෙවිමැදුරේ සිතුවම් අතර තුවාල ලැබූවකුට ප්‍රතිකාර කෙරෙන .......................... නැමැති සිතුවමින් හැඟිම්බර අවස්ථාවක් නිරූපණය වේ.

**27.** 'අවසාන භෝජන සංග්‍රහය' සිතුවම සංරචනයේදී අඳුරු පරිසරය තුළ ජේසුස් වහන්සේ ඇතුළු පිරිස ආලෝකමත්ව දැක්වීමේ සිද්ධාන්තය .......................... ලෙස හැඳින්වේ.

**28.** වේදනාව, භය, ත්‍රාසය, උත්සාහය නිරූපිත හෙලනිස්ටික් යුගයට අයත් .......................... මූර්තිය යථාර්ථවාදී ශෛලිය අනුව කළ නිර්මාණයකි.


**29.** බුදුන් වහන්සේ පස්වග තවුසන්ට ප්‍රථම ධර්ම දේශනය පැවැත්වූ අවස්ථාව ඉන්දියාවේ .......................... පිළිමයෙන් නිරූපණය වේ.


**30.** තෙත් බදාමය මතුපිට චිත්‍ර ඇඳීමේ සාම්ප්‍රදායික ශිල්ප ක්‍රමය .......................... ලෙස හඳුන්වයි.


Download all Past Papers➤ https://bookbeekid.com/resource/past-papers/


● අංක **31** සිට **35** තෙක් දී ඇති ප්‍රශ්නවලට **A, B, C,D, E** යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


A


B


C


D


E

**31.** **A** අක්ෂරයෙන් දැක්වෙන සිතුවම් කොටස උපුටාගෙන ඇති සිතුවම කුමක් ද?

..............................................................................................................

**32.** **B** අක්ෂරයෙන් දැක්වෙන අචල භක්තිය නිසා නාරි සුන්දරත්වය අහිමි කරගත් කාන්තා රුව කුමන නමකින් හැඳින්වේ ද?

..............................................................................................................

**33.** **C** අක්ෂරයෙන් දැක්වෙන සාංචි තොරණ කැටයමින් නිරූපිත තේමාව කුමක් ද?

..............................................................................................................

**34.** **D** අක්ෂරයෙන් දැක්වෙන මිනිස් මුහුණ සමග සත්ත්ව ශරීරයක් බද්ධ කිරීමෙන් සැකසුණු කල්පිත මූර්තිය කුමක් ද?

..............................................................................................................

**35.** **E** අක්ෂරයෙන් දැක්වෙන කාටූන් චරිතය නිර්මාණය කළ ශිල්පියා කවුද?

..............................................................................................................

● ඔබ වෙත සපයා ඇති වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට **40** තෙක් දී ඇති උපමාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය **පහක්** ලියන්න. (තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු නොලැබීමට හේතුවක් වනු ඇත.)

**36.** ශිල්පියා පිළිබඳව :..............................................................................

..............................................................................

**37.** තේමාව පිළිබඳව :..............................................................................

..............................................................................

**38.** සංරචනය කර ඇති අයුරු :..............................................................................

..............................................................................

**39.** වර්ණ භාවිතය පිළිබඳව :..............................................................................

..............................................................................

**40.** ප්‍රකාශිත හැඟීම් :..............................................................................

..............................................................................

❊ ❊ ❊

Department of Examinations - Sri Lanka

OL/2020/43-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

**චිත්‍ර I / சித்திரம் I / Art I**

- ප්‍රශ්න අංක **36** සිට **40** දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සිතුවම භාවිත කරන්න.

  வினா இலக்கம் **36** தொடக்கம் **40** வரையிலான வினாக்களுக்கு விடையளிப்பதற்கு கீழே தரப்பட்டுள்ள உருவப்படத்தினை பயன்படுத்துக.

  Use the following painting to answer the questions from No. **36** to **40**.



* * *

## 43 - චිත්‍ර

1. ගඩලාදෙණිය
2. ගණේශ්වරාචාර්යයා
3. විජයනගර්
4. ශෛලමය / කලුගල්
5. පාදමේ
6. යාලී රුව
7. • පොළොන්නරු ගල් විහාරයේ හිටි බුදු පිළිමය
   • උත්තරාරාමයේ හිටි බුදු පිළිමය
8. තාවඩි මු. තුරෙයිසාමි
9. වාස්තු ශිල්ප ක්‍රමය
10. සම්භාව්‍ය යුගයට , ක්‍රි.පූ. 330 - 320 කාලයට
11. 3
12. 4
13. 4
14. 2
15. 3
16. උත්සව අවස්ථාවල දී පොල්තෙල් පහන තැබීම සඳහා බිම සරසන සැරසිල්ලකි.
17. කිසියම් වස්තුවක දිග, ඉදිරියෙන් පෙනීමේ දී කෙටි වී පෙනෙන අයුරු දැක්වීමේ ශිල්ප ක්‍රමය.
18. මිසර සිතුවම් පසුබිමෙහි දක්නට ලැබෙන අක්ෂර විශේෂයකි. මෙය රූපාක්ෂර යනුවෙන් ද හැඳින්වේ.
19. • ඉස්ලාම් පල්ලිවල වහලයේ දක්නට ලැබෙන රටළුණු ගෙඩියේ හැඩය ගත් වාස්තු විද්‍යාත්මක අංගයයි.
   • හින්දු ආගමික උත්සවවලදී කළය භාවිත කර සකසන ලද සැරසිළි විශේෂයකි.
20. • හින්දු ආගමික උත්සව අවස්ථා සඳහා භාවිත කරන දැව නිමාවෙන් යුතු වාහනයකි.
   • දෙවියන් වැඩමකරවීම සඳහා නිර්මාණය කරන ලද දැව වාහන විශේෂය යි.

Department of Examinations - Sri Lanka


Download all Past Papers > https://bookbeekid.com/resource/past-papers/

21. **D**
22. **E**
23. **B**
24. **A**
25. **C**

26. යහපත් සමරිතානුවරයා / යහපත් ආගන්තුක සත්කාරකරු
27. කියරොස්කුරෝ (CHIAROSCURO)
28. ලැවකුන්
29. සාරානාත් බුදු පිළිමය
30. ෆ්‍රෙස්කෝ බුවනෝ

31. සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධිය වැඩම වීම. / දුම්න්දාගමනය
32. කාරයික්කාර් අම්මෙයියාර්
33. 
    - බුදුන් වහන්සේ සංකස්ස පුරයට වැඩම කිරීම.
    - සංකස්සපුර හිනිමං දර්ශනය
34. ස්පිනික්ස්
35. කැමිලස් පෙරේරා

36. එම්. සාර්ලිස් ශිල්පියා විසින් අඳින ලද සිතුවමකි.
37. සිදුහත් කුමරු පියුම්පිට වැඩීම මෙම චිත්‍රයෙන් නිරූපණය කර ඇත.
38. 
    - පෙරබිම, මැදබිම සහ පසුබිම පැහැදිලිව දක්වෙන සේ සිද්ධි ගණනාවක් චිත්‍රණය කර ඇත.
    - චිත්‍රයේ අවකාශය, ගැඹුර මතුවන සේ පර්යාලෝක ලක්ෂණ පෙන්වමින් ස්වභාවිකවාදී ශෛලයකින් ඇඳ ඇත.
39. 
    - ත්‍රිමාණ ලක්ෂණ මතුවන සේ එළිය අඳුර දක්වමින් දියසායම් මාධ්‍යයෙන් වර්ණ ගන්වා ඇත.
    - දිය සායම් මාධ්‍යයෙන් අඳින ලද මෙම සිතුවම ලිතෝ මුද්‍රණයෙන් මුද්‍රණය කර ඇත.
40. 
    - ආගමික භක්තිය දනවන අයුරින් ශිල්පියා සිතුවම නිර්මාණය කර ඇත.
    - '' සිදුහත් කුමරුගේ පියුම්පිට වැඩිම '' ආශ්චර්යයමත් සිද්ධියක් ලෙස පෙන්නුම් කිරීමට ශිල්පියා සමත්ව ඇත.
    - බුද්ධාලම්භන ප්‍රීතිය මතුකරන අයුරින් නිර්මාණය කිරීමට ශිල්පියා සමත්ව ඇත.


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

OL/2020/43-S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

**චිත්‍ර II**
**சித்திரம் II**
**Art II**

*පැය දෙකයි*
*இரண்டு மணித்தியாலம்*
*Two hours*

**සැලකිය යුතුයි :**

- ✳ ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
- ✳ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට ද්‍රව මාධ්‍ය භාවිතා කරන ලද සිතුවම් වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- ✳ දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය.
- ✳ ද්‍රව්‍ය සමූහය 73cm පමණ උස පැතැලි ඩෙස්ක් එකක් මත තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත.

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

✳ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති A 4 ප්‍රමාණයේ සුදු කඩදාසිය භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ චිත්‍ර ඇඳීමේ කඩදාසිය භාවිත කරන්න.

✳ **ඉහත 1 සහ 2 චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**

✳ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- **නිදහස් රේඛා අධ්‍යයනය**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව රේඛා අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා (ලකුණු 05)

- **වර්ණ චිත්‍රය**

2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම (ලකුණු 05)
3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය (ලකුණු 05)
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දැක්වීම (ලකුණු 05)
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා (ලකුණු 05)
6. උචිත වර්ණවත් පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව (ලකුණු 05)

**සැලකිය යුතුයි:**

✳ ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

✳ ✳ ✳

Department of Examinations - Sri Lanka


Download all Past Papers➤ https://bookbeekid.com/resource/past-papers/

## 11. පත්‍රය - නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

### ඉගෙනුම් ඵල

1 - ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ගති ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව හා සිද්ධාන්ත භාවිතයේ කුසලතාව හා ක්‍රමශිල්ප භාවිතය මැන බැලීම.

2 - රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන්ගේ ගති ලක්‍ෂණ නිරූපණය වන සේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.

3 - වර්ණ භාවිත කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්‍ෂණ මතුවන සේ වර්ණ භාවිතය පිළිබඳ හැකියාව මැන බැලීම.

11. පත්‍රය සඳහා අපේක්‍ෂකයන් සපයන ලද ප්‍රායෝගික පිළිතුරු අතර චිත්‍ර දෙකක් වෙයි. ඉන් එකක් රේඛා මගින් කරනු ලබන අධ්‍යයනයක් වන අතර අනෙක වර්ණ චිත්‍රයකි. මෙම චිත්‍ර දෙකම ඇගයීමට භාජනය කළ යුතු ය. ලකුණු දීමේ පටිපාටියේ පළමුවන නිර්ණායකය රේඛා අධ්‍යයනය සඳහා යොදා ගත යුතු වේ.

Department of Examinations - Sri Lanka




Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## රේඛා අධ්‍යයනය

මෙයින් අපේක්ෂා කෙරෙනුයේ අපේක්ෂකයා විසින් තමා ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය පිළිබඳව මූලික අධ්‍යයනයක යෙදීමයි. සමහරු මෙය තේරුම් ගෙන ද්‍රව්‍යයන්ගේ හැඩ වෙන වෙනම අධ්‍යයනය කළ අවස්ථා දක්නට ඇතත් සමහර අපේක්ෂකයෝ එම ද්‍රව්‍ය සමූහයේ රේඛා චිත්‍රයක් ඇඳ දක්වති. කෙසේ වෙතත් මෙම රේඛා අධ්‍යයනය තුළින් රේඛාව හැසිරවීමේ කුසලතාව පිළිබිඹු විය යුතු වේ. මේ අනුව අපේක්ෂකයා රේඛාව පිළිබඳ ප්‍රදර්ශනය කර ඇති කුසලතාව ගැන සලකා ඒ සඳහා හිමි ලකුණු පහෙන් ( 05 ) දිය යුතු ලකුණු ප්‍රමාණය ( 1.වැනි නිර්ණායකයට අනුව ) තීරණය කළ යුතු වේ.

## වර්ණ චිත්‍රය

මෙයින් ද්‍රව්‍ය සමූහය ඇසුරෙන් යථාරූපී චිත්‍රයක් ඇඳ වර්ණ කර නිම කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා ලකුණු ප්‍රදානය කිරීමේ දී අදාළ නිර්ණායකයන් යටතේ ම ලකුණු තීරණය කළ යුතු වේ. එකිනෙක නිර්ණායකයන් යටතේ අපේක්ෂකයා කොතෙක් දුරට ලඟා වී ඇත්දැයි නිවැරදි තීරණයකට එළඹ ලකුණු තීරණය කළ මැනවි. මෙහිදී තම රුචිය අනුව චිත්‍රය ඇගයීමට භාජනය නොකළ යුතු අතර අපේක්ෂකයා ප්‍රදර්ශනය කර ඇති කුසලතා තේරුම් ගෙන එය පදනම් කරගෙන ඇගයීම කළ යුතු වේ.

## ලකුණු දීමේ නිර්ණායක

| | |
|---|---|
| 1 - රේඛා අධ්‍යයනය | - ලකුණු 05 |
| 2 - ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත්ව සංරචනය කිරීමේ හැකියාව | - ලකුණු 05 |
| 3 - ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | - ලකුණු 05 |
| 4 - සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) | - ලකුණු 05 |
| 5 - වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම | - ලකුණු 05 |
| 6 - චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව | - ලකුණු 05 |
| ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 30 |

Department of Examinations - Sri Lanka


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

OL/2020/43-S-III

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 S III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

චිත්‍ර III
சித்திரம் III
Art III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**සැලකිය යුතුයි :**

- ඔබ ඇඳිය යුත්තේ **එක** චිත්‍රයක් පමණි.
- ඔබේ **විභාග අංකය** හා අදාළ **ප්‍රශ්න අංකය** උත්තර පත්‍රයේ නියම කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකි ය.
- ඇඳීමේ සුදු කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ.

'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ **එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.**

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

**1.** කුණාටුව සමඟ පොරබදන මුහුදු ගිය ධීවරයෝ

**2.** පාසලේ සිඟිති පොළක අවස්ථාවක් / 'එළුවන් කන්නයි මං ආවේ' ජන ක්‍රීඩාවේ අවස්ථාවක්

**3.** නාන ලිඳ ළඟ කතා බහ

**4.** ගම් වැදුනු අලි රංචුවක්

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

**5.** සමචතුරස්‍රාකාර හැඩැති කුෂන් කවරයක් සඳහා සාම්ප්‍රදායික සැරසිලි ඒකක ඇසුරෙන් අඟල් $8 \times 8$ ප්‍රමාණයේ මුලුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.

**6.** අට පෙති මල ඇසුරෙන් චීත්ත රෙද්දක් සඳහා මුද්‍රණයට උචිත ව්‍යාප්ත මෝස්තරයක් අඟල් $9 \times 9$ ප්‍රමාණයේ අවකාශයක් තුළ නිර්මාණය කරන්න. (ව්‍යාප්තිය ගැන සැලකිලිමත් වන්න.)

**7.** සත්ව හා ශාක හැඩතල වියුක්තරූපීව යොදා ගනිමින් අඩි $10 \times 7$ ප්‍රමාණයේ වර්ණවත් බිත්ති සැරසිල්ලක් සැලසුම් කරන්න. (කඩදාසියට ගැලපෙන පරිදි පරිමාණානුකූලව සැලසුම් කරන්න.)

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර

**8.** 'පිරිසිදු දෑත් සුරකියි අප සැම' යන මැයෙන් වසංගත රෝගවලින් ආරක්ෂාවීම සඳහා දෑත් පිරිසිදුව තබා ගැනීමේ අගය හා වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා උචිත වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

**9.** කම්කරු ශ්‍රමය අගයමින් රචිත කවි පෙළකට උචිත වර්ණවත් සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.

**10.** සත්ව හා මිනිස් චරිත ඇසුරු කොටගෙන නිර්මාණය කරන ළමා කථා පොතකට උචිත වර්ණවත් පිටකවරයක් (මුල් පිටුව පමණක්) නිර්මාණය කරන්න.

* * *

Department of Examinations - Sri Lanka


Download all Past Papers ➢ https://bookbeekid.com/resource/past-papers/

## 111. පත්‍රය - 1. කොටස - චිත්‍ර සංරචනය

**ඉගෙනුම් ඵල** - ස්වභාවධර්මයේ දක්නට ලැබෙන ස්වාභාවික මෙන්ම නිර්මිත පරිසරයන්ගේ හා වස්තූන්ගේ ස්වභාවයත් ඒ තුළ සිදුවන සිද්ධීන් හා ක්‍රියාදාමයන් පිළිබඳවත් ලබා ඇති අත්දැකීම් චිත්‍රමය භාෂාව තුළින් ප්‍රකාශ කිරීමේ නිර්මාණශීලී කුසලතාව හා රසඥතා වර්ධනය පිළිබඳ නිපුණතා ඇගයීම.

අපේක්ෂකයන් තෝරාගෙන ඇති මාතෘකා ප්‍රකාශ කිරීමේ දී විවිධ මට්ටමේ කුසලතා ප්‍රදර්ශනය කර ඇති අයුරු දක්නට ලැබේ. රේඛාව හැසිරවීමේ හා හැඩතල ප්‍රකාශනයේ දී අවම කුසලතා මෙන් ම උපරිම කුසලතා ප්‍රදර්ශනය කළ අවස්ථා මෙන් ම මානව රුව හැසිරවීමේදී ද එවැනි ම විෂමතා දක්නට ලැබෙන අවස්ථා එමට ය. වර්ණ භාවිතය තුළින් ද විවිධ වූ ශිල්ප ක්‍රම භාවිතයෙන් උපරිම කුසලතා දක්වන අය අතර ප්‍රායෝගික කුසලතා පෝෂණය කර නො ගත් අපේක්ෂකයෝ ද වෙති. මේ නිසා එකිනෙක අපේක්ෂකයන් පෙන්වා ඇති ප්‍රායෝගික කුසලතාවන්ගේ මට්ටම හඳුනාගෙන ඒ අනුව නිර්ණායකයන් පදනම් කරගෙන ලකුණු ප්‍රදානය කළ යුතු වේ. මෙහිදී ද පුද්ගල බද්ධ රුචිකත්වය ගැන නොසලකා ලකුණු ප්‍රදානය කළ මැනවි.

### ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1 - | තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේදී ඊට උචිත වාතාවරණය හා පරිසරය ප්‍රකාශ කර ඇති අයුරුව | - ලකුණු 06 |
| 2 - | රේඛා හැඩතල ඇසුරෙන් මානව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරුව | - ලකුණු 06 |
| 3 - | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය ( පරිමාණ, පර්යාලෝකය, ත්‍රිමාණ ලකෂණ, ඇස්මට්ටම හා අවකාශ භාවිතය) | - ලකුණු 06 |
| 4 - | වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාව | - ලකුණු 06 |
| 5 - | අනුගමනය කර ඇති ශෛලීය හා සමස්ත නිමාව | - ලකුණු 06 |
| | ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 30 |

## 111. පත්‍රය - 11 කොටස - මෝස්තර නිර්මාණය

**ඉගෙනුම් ඵල** - දෛනික ජීවිතයේ ඇතිවන විවිධ පාරිභාරික අවශ්‍යතාවන්ට සරිලන පරිදි භාණ්ඩ හා සැරසිලි නිර්මාණ සැලසුම්කරණය හා අලංකරණය පිළිබඳ අපේක්ෂකයා ලබා ඇති කුසලතා පිරික්සීම

Department of Examinations - Sri Lanka


Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

111, පත්‍රයට පිළිතුරු සැපයීමේ දී බහුතර අපේක්ෂක සංඛ්‍යාවක් 11 කොටස තෝරාගන්නා බව පෙනේ. මොවුන් අතුරින් වැඩි දෙනෙක් සිද්ධාන්තමය අවබෝධයකින් යුතුව නවතාවකින් යුතු මෝස්තර නිර්මාණයේ යෙදෙන අතර අනවබෝධයෙන් මෝස්තර නිර්මාණය කිරීමට වෙහෙසෙන අය ද බොහෝ ය. කෙසේ වෙතත් අපේක්ෂකයන්ගේ නිර්මාණ තුළින් පිළිබිඹු වන්නේ ඔවුන් අත්පත් කරගෙන ඇති නිපුණතාවන්ගේ පරිමාණයයි. නිර්ණායකයන් ඔස්සේ ඔවුන් දක්වා ඇති නිපුණතාවන්ගේ ප්‍රමාණයන් තේරුම් ගෙන ලකුණු ප්‍රදානය කිරීම කළ යුතු වේ.

## ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1 - | මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | - ලකුණු 06 |
| 2 - | පාරිභාරික අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව | - ලකුණු 06 |
| 3 - | රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | - ලකුණු 06 |
| 4 - | උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | - ලකුණු 06 |
| 5 - | විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | - ලකුණු 06 |
| | ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 30 |

## 111 පත්‍රය - 111 කොටස - ග්‍රැෆික් චිත්‍ර

**ඉගෙනුම් ඵල** - සන්නිවේදන කාර්යය , මුද්‍රණ ක්‍රියාවලිය හා වාණිජ අවශ්‍යතාවන්ට සරිලන චිත්‍රකලා නිර්මාණ හා සැලසුම්කරණය පිළිබඳ අපේක්ෂකයා ලබා ඇති නිපුණතා පිරික්සීම

මෙය අ.පො.ස. (සා පෙළ) ප්‍රශ්නපත්‍රයට එක් වූ නව කොටසකි. ග්‍රැෆික් චිත්‍ර කලාව පිළිබඳව පන්ති කාමරයේ දී ප්‍රගුණ කළ ශිල්ප ක්‍රම හා කුසලතා උපයෝගී කරගෙන ශිෂ්‍යයා මෙම කොටසට පිළිතුරු සපයයි. ඇගයීමේ දී ඔවුන් දක්වා ඇති නිපුණතා හොඳින් හඳුනාගෙන ප්‍රකාශනයේ නිර්මාණශීලී බව සලකා ලකුණු ප්‍රදානය කිරීම කළ යුතු වේ.

## ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1 - | මාතෘකාවට උචිත අයුරින් නවතාවකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | - ලකුණු 06 |
| 2 - | වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා මුද්‍රණයට උචිත බව | - ලකුණු 06 |
| 3 - | රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | - ලකුණු 06 |
| 4 - | උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ හැකියාව | - ලකුණු 06 |
| 5 - | විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | - ලකුණු 06 |
| | ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 30 |

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

උත්තර පත්‍ර නැවත සමීක්ෂණයන්හිදී ඇතැම් පරීක්ෂකවරුන් අතින් සිදු වූ බරපතල වැරදි ගැන වාර්තා වූ අවස්ථා බොහෝ ය. එවැනි වැරදි සිදුවීම් වළක්වා ගැනීම පරීක්ෂක වරුන්ගේ දැඩි වගකීමක් වනු ඇත.

### එසේ වාර්තා වී ඇති වැරදි අතර ----

- වැරදි පිළිතුරු ✓ පිළිතුරු සේත්, හරි පිළිතුරු ✗ පිළිතුරු සේත්, සලකා ලකුණු කර තිබීම.
- ඇතැම් පිළිතුරු ලකුණු නොකොට මගහැරී තිබීම.
- ලකුණු කිරීමේදී යොදන ලකුණු තේරුම් ගැනීමට නොහැකි වීම.
- ලකුණු එකතු කිරීමේ දී සිදුවූ වැරදි,
- 11, 111, වැනි ප්‍රායෝගික උත්තර පත්‍ර නිසි ලෙස ඇගයීමට ලක් නොවීම.
- 11, 111, පත්‍රවල නිර්ණායක නොසලකා ලකුණු ප්‍රධානය කිරීම.
- දෙවනවර පරීක්ෂා කළ බවට සහකාර පරීක්ෂකවරයාගේ සංකේත අංකය සහ කෙටි අත්සන යොදා නොතිබීම.
- ඉලක්කම් පැහැදිළිව යොදා නොතිබීම.
- ඉතා ඉහල මට්ටමේ කුසලතා ප්‍රදර්ශනය කර ඇති උත්තර පත්‍රවලට අඩු ලකුණකුත් , කුසලතා ප්‍රදර්ශනය නොවන සමහර චිත්‍රවලට ඉහළ ලකුණකුත් ප්‍රදානය කිරීම.
- ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණ අභිබවා යමින් උවමනාවෙන්ම සාමර්ථ්‍ය හෝ සම්මාන ප්‍රදානය කිරීමට උත්සාහ දැරීම.

වැනි වැරදි පෙන්වා දිය හැකි ය. මෙයින් බරපතලම වරද ලෙස පෙන්වා දිය හැක්කේ 11, 111, පත්‍රවල සිදුවන අධි තක්සේරුව හා ඌණ තක්සේරුවයි. මේ නිසා නැවත සමීක්ෂණයේදී ලකුණු විශාල ලෙස ඉහළ පහළ ගිය අවස්ථා බොහෝ ය. මෙවැනි සිදුවීම් සම්පූර්ණයෙන් ම මගහරවා ගැනීම සියලුම පරීක්ෂක වරුන් ගේ දැඩි වගකීමකි.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ඇගයීම් කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමෙන් හා ලකුණු ලැයිස්තු ක්‍රමවත්ව පිළියෙල කිරීමෙන් ඵලදායි ඇගයීමකට දායක වීම දැයේ දරුවන් වෙනුවෙන් ඉටුකෙරෙන ජාතික මෙහෙවරක් වනු ඇත.

Department of Examinations - Sri Lanka

> සැලකිය යුතුයි ,
> ඔබ වෙත සපයන ලද RD / 16 / 3 /OL ආකෘති පත්‍ර දෙකෙන් එකක් මණ්ඩලයේ වැඩ නිමවූ දිනම ප්‍රධාන පාලක පරීක්ෂක වෙත තැපැල් කර යවන්න.

- මුල් පිටුවේ ලකුණු අවසන් ලකුණු ලැයිස්තුවට ගැනීමේ දී සිදු වූ වැරදි,
- එකිනෙක පත්‍රවල අවසාන ලකුණ වටරවුමකින් නොදැක්වීම.

Download all Past Papers➢ https://bookbeekid.com/resource/past-papers/

උත්තර පත්‍ර නැවත සමීක්ෂණයන්හිදී ඇතැම් පරීක්ෂකවරුන් අතින් සිදු වූ බරපතල වැරදි ගැන වාර්තා වූ අවස්ථා බොහෝ ය. එවැනි වැරදි සිදුවීම් වළක්වා ගැනීම පරීක්ෂක වරුන්ගේ දැඩි වගකීමක් වනු ඇත.

**එසේ වාර්තා වී ඇති වැරදි අතර ----**

- ★ වැරදි පිළිතුරු ✓ පිළිතුරු සේත්, හරි පිළිතුරු ✗ පිළිතුරු සේත්, සලකා ලකුණු කර තිබීම.
- ★ ඇතැම් පිළිතුරු ලකුණු නොකොට මගහැරී තිබීම.
- ★ ලකුණු කිරීමේදී යොදන ලකුණු තේරුම් ගැනීමට නොහැකි වීම.
- ★ ලකුණු එකතු කිරීමේ දී සිදුවූ වැරදි,
- ★ 11, 111, පත්‍රවල ලකුණු මුල් පිටුවට ගැනීමේ දී සිදු වූ වැරදි,
- ★ 11, 111, වැනි ප්‍රායෝගික උත්තර පත්‍ර නිසි ලෙස ඇගයීමට ලක් නොවීම.
- ★ 11, 111, පත්‍රවල නිර්ණායක නොසලකා ලකුණු ප්‍රධානය කිරීම.
- ★ දෙවනවර පරීක්ෂා කළ බවට සහකාර පරීක්ෂකවරයාගේ සංකේත අංකය සහ කෙටි අත්සන යොදා නොතිබීම.
- ★ ඉලක්කම් පැහැදිළිව යොදා නොතිබීම.
- ★ ඉතා ඉහල මට්ටමේ කුසලතා ප්‍රදර්ශනය කර ඇති උත්තර පත්‍රවලට අඩු ලකුණකුත් , කුසලතා ප්‍රදර්ශනය නොවන සමහර චිත්‍රවලට ඉහළ ලකුණකුත් ප්‍රදානය කිරීම.
- ★ ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණ අභිබවා යමින් උවමනාවෙන්ම සාමර්ථ්‍ය හෝ සම්මාන ප්‍රදානය කිරීමට උත්සාහ දැරීම.

වැනි වැරදි පෙන්වා දිය හැකි ය. මෙයින් බරපතලම වරද ලෙස පෙන්වා දිය හැක්කේ 11, 111, පත්‍රවල සිදුවන අධි තක්සේරුව හා ඌණ තක්සේරුවයි. මේ නිසා නැවත සමීක්ෂණයේදී ලකුණු විශාල ලෙස ඉහළ පහළ ගිය අවස්ථා බොහෝ ය. මෙවැනි සිදුවීම් සම්පූර්ණයෙන් ම මගහරවා ගැනීම සියලුම පරීක්ෂක වරුන් ගේ දැඩි වගකීමකි.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ඇගයීම් කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමෙන් හා ලකුණු ලැයිස්තු ක්‍රමවත්ව පිළියෙල කිරීමෙන් ඵලදායී ඇගයීමකට දායක වීම දැයේ දරුවන් වෙනුවෙන් ඉටුකෙරෙන ජාතික මෙහෙවරක් වනු ඇත.

සැලකිය යුතුයි ,
ඔබ වෙත සපයන ලද RD / 16 / 3 /OL ආකෘති පත්‍ර දෙකෙන් එකක් මණ්ඩලයේ වැඩ නිමවූ දිනම ප්‍රධාන පාලක පරීක්ෂක වෙත තැපැල් කර යවන්න.


Download all Past Papers➢ https://bookbeekid.com/resource/past-papers/

**ලකුණු දීමේ පටිපාටියේ සංශෝධන හා සටහන :**


Download all Past Papers > https://bookbeekid.com/resource/past-papers/